## පාසල් ළමුන් සඳහා විද්‍යා රචනා තරගය: 10 ශ්‍රේණිය සහ ඉහළ

සංවිධානය: විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා වූ කමිටුව, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS)

මෙම තරගයේ අරමුණ පාසල් සිසුන් අතර විද්‍යාව ප්‍රචලිත කිරීම, ඔවුන්ගේ විද්‍යා ලේඛන කුසලතා ඔප්නැංවීම සහ දරුවන් සිතීමට පෙළඹවීමයි.

## රචනා මාතෘකා

English: The Digital Child: How Technology is Reshaping Lives of Children.

Sinhala: ඩිජිටල් දරුවා: ඩිජිටල් තාක්ෂණයෙන් දරුවන්ගේ ජීවිතය හැඩගැස් වීම

தமிழ்: எண்ணியல் சிறுவர்: நவீன தொழில்நுட்பம் சிறார்களின் வாழ்க்கையை எவ்வாறு மாற்றி அமைக்கின்

## අයදුම්කරුවන් සඳහා නීති

- මෙම තරඟය ශ්‍රී ලංකාවේ 10 ශ්‍රේණියේ සහ ඊට ඉහල සිසුන් සඳහා විවෘතය.
- මාධ්‍ය - ඉංග්‍රීසි / සිංහල / දෙමළ.
- එක් සිසුවෙකුට රචනයක් ඉදිරිපත් කළ හැක්කේ එක් භාෂාවකින් පමණි.
- අයදුම්කරු ඔහුගේ/ඇයගේ පාසලේ ශිෂ්‍යයෙකු බවත් රචනය ලියා ඇත්තේ ශිෂ්‍යයා බවත් පාසලේ විදුහල්පති / ප්‍රධානියා සහතික කළ යුතුය.
- රචනය පැහැදිලි අත් අකුරින් ලිවීම හෝ මුද්‍රිත විය යුතුය
- අපැහැදිලි අත් අකුරින් ලියන ලද රචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- රචනය වචන 750කට නොඅඩු සහ වචන 1000කට නොවැඩි විය යුතුය.
- SLAAS හි කවුන්සිලයේ, ව්‍යවස්ථාපිත කමිටු සහ අනෙකුත් කමිටු නිලධාරීන්ගේ සහ සාමාජිකයින්ගේ දරුවන් මීට සහභාගී වීමට සුදුසුකම් නොලබයි.
- එක් සිසුවෙකුට එක් රචනාවක් පමණක් ඉදිරිපත් කිරීමට අවසර ලැබේ.

## ත්‍යාග

- භාෂා තුනෙන්ම සෑම පළාතකින්ම 1, 2 සහ 3 ස්ථාන සඳහා ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ
- 1, 2 සහ 3 ස්ථාන දිනා ගන්නා සිසුවා හෝ සිසුවිය ඉගෙනුම ලබන පාසල පළාතෙන් 1, 2 සහ 3 ස්ථාන දිනා ගන්නා පාසල ලෙස සලකනු ලැබේ.
- ජයග්‍රාහී සිසුන් සහ ජයග්‍රාහී පාසල් සඳහා වන තිළින සහතිකපත් 2024 දෙසැම්බර් මස කොළඹදී පැවැත්වෙන ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) වාර්ෂික සැසිවාරයේදී ප්‍රදානය කෙරේ.
- පළමු ස්ථානය දිනාගත් රචනා සහ කතුවරුන්ගේ ඡායාරූප වාර්ෂික සැසිවාරයේදී සහ SLAAS වෙබ් අඩවියේ පෝස්ටරයක් ලෙස ප්‍රදර්ශනය කෙරේ.
- ජයග්‍රාහකයින් සම්බන්ධයෙන් SLAAS කවුන්සිලයේ තීරණය අවසාන තීරණය වේ.

## සහභාගී විය යුතු ආකාරය

- පහත දක්වා ඇති අයදුම් පත්‍රය සම්පූර්ණ කරන්න
- අයදුම්කරු ඔහුගේ/ඇයගේ පාසලේ ශිෂ්‍යයෙකු බවත්, එම රචනය ශිෂ්‍යයා විසින් ලියන ලද්දක් බවටත් පාසලේ විදුහල්පති / ප්‍රධානියාගෙන් සහතිකයක් ලබාගන්න.

- සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය සහ රචනය පහත ලිපිනයට තැපැල් කරන්න:

ලේකම්, CPS, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය 120/10, විද්‍යා මන්දිරය, විද්‍යා මාවත, කොළඹ 7. (ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ “විද්‍යා රචනා තරගය” යනුවෙන් සඳහන් කළ යුතුය)

අයදුම්පත් සහ රචනා ඉහත ලිපිනයට **01 st June 2024** දිනට පෙර ළඟා විය යුතුය.

# අයදුම්පත

1. ශිෂ්‍යයාගේ සම්පූර්ණ නම. ------------------------------------------------------------

2. ශිෂ්‍යයාගේ වයස. ---------------------------------------------------------------------

3. ශිෂ්‍යයාගේ ශ්‍රේණිය. ------------------------------------------------------------------

4. ශිෂ්‍යයාගේ දුරකථන අංකය. ---------------------------------------------------

5. ශිෂ්‍යයාගේ තැපැල් ලිපිනය. ---------------------------------------------------

6. විද්‍යුත් තැපැල් ලිපිනය (විකල්ප)------------------------------------------------

7. පාසලේ නම. -----------------------------------------------------------------

8. පාසලේ ලිපිනය. ------------------------------------------------------------

9. පාසල අයත් පළාත. --------------------------------------

10. පාසලේ දුරකථන අංකය. ---------------------------------------------------

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා වූ කමිටුව (CPS) විසින් පවත්වනු ලබන විද්‍යා රචනා තරගයට ඇතුළත් වීමට මම කැමැත්තෙමි. මෙම තරඟය සඳහා SLAAS විසින් පනවා ඇති නීතිරීතිවලට අනුකූල වීමට ද මම එකඟ වෙමි. විද්‍යා රචනා තරගය සඳහා මගේ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සහ මගේ රචනාව මේ සමඟ අමුණමි. රචනය මා විසින් සම්පාදනය සහ ලියන ලද්දක් බව මම ප්‍රකාශ කරමි.

ශිෂ්‍යයාගේ අත්සන. :-

**<u>පාසලේ විදුහල්පති / ප්‍රධානියාගේ අනුමත කිරීම</u>**

-------------------------------------------- ------------------------------------------------------------------
------------------------------------------------ මාගේ පාසලේ ශිෂ්‍යයෙක් වන අතර එම රචනය අයදුම්කරු විසින් ලියන ලද්දක් බව මෙයින් සහතික කරමි.

මෙම ශිෂ්‍යයා පළාතෙන් 1, 2 හෝ 3 වැනි ස්ථාන ලබා ගන්නේ නම්, මගේ පාසල පළාතෙන් 1, 2 හෝ 3 ස්ථාන දිනා ගන්නා පාසල ලෙස ප්‍රකාශයට පත් කරන බවට ඇති කොන්දේසිය මම පිළිගනිමි.

විදුහල්පතිවරයාගේ නම:-
පාසලේ නම:-

අධ්‍යාපනික පළාත:-

විදුහල්පතිගේ අත්සන:-

(කරුණාකර පාසලේ නිල මුද්‍රාව තබන්න)